Australian Government
Office of the Australian Information Commissioner

# සංක්‍රමණ දත්ත උල්ලංඝනය සම්බන්ධ පුද්ගලිකතා පැමිණිල්ල

## පසුබිම

2014 පෙබරවාරි 10 වන දින, සංක්‍රමණ සහ දේශ සීමා ආරක්ෂණ දෙපාර්තමේන්තුව (දැනට දේශීය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව) (**දෙපාර්තමේන්තුව**) සිය වෙබ් අඩවියේ පුද්ගලික තොරතුරු ඇතුළත් සංක්‍රමණ වාර්තාවක් වැරදීමකින් පළ කරන ලදී (**දත්ත උල්ලංඝනය කිරීම**).

2014 ජනවාරි 31 දිනයේ සංක්‍රමණ රැඳවුමේ සිටි සියළුම පුද්ගලයන් 9,258 දෙනාගේ තොරතුරු වාර්තාවේ ඇතුළත් විය.

2015 අගෝස්තු 30 වන දින, ඕස්ට්‍රේලියානු තොරතුරු කොමසාරිස්වරයාගේ කාර්යාලය (Office of the Australian Information Commissioner (**OAIC**)) වෙත දෙපාර්තමේන්තුවේ වැරදීමෙන් නම් පළකල සියළුම පුද්ගලයන් වෙනුවෙන් නියෝජන පැමිණිල්ලක් යොමු කරන ලදී (**පංති සාමාජිකයන්**). පැමිණිල්ල මගින් දෙපාර්තමේන්තුව විසින් සමාව ඇයදීමත්, වන්දි ගෙවීමත් ඉල්ලා සිටින ලදී.

2018 පෙබරවාරි 9 වන දින, මුල් නියෝජන පැමිණිලිකරුගේ සොලිසිටර්වරයා විසින් OAIC වෙත උපදෙස් ලබා දුන්නේ ඔවුන්ගේ සේවාදායකයා මියගොස් ඇති බවයි. 2018 දෙසැම්බර් 10 වන දින කොමසාරිස්වරයා විසින් 1988 පුද්ගලිකතා පනතේ 38ආ(1) වගන්තිය ප්‍රකාරව (**පුද්ගලිකතා පනත**) නියෝජිත පැමිණිලිකරු වෙනුවට වෙනත් පංති සාමාජිකයෙකු (**නියෝජිත පැමිණිලිකරු**) මගින් පැමිණිල්ල ප්‍රතිස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. නියෝජිත පැමිණිලිකරු වෙනුවෙන් ස්ලේටර් සහ ගෝඩන් කටයුතු කරයි. ස්ලේටර් සහ ගෝඩන් සම්බන්ධ තොරතුරු ඔවුන්ගේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිවේ.

2018 ජනවාරි මස 24 වන දින කොමසාරිස්වරයා විසින් දැනුම් දුන්නේ (**දැන්වීම**) කිසියම් පංති සාමාජිකයෙකු හට දත්ත උල්ලංඝනය මගින් පාඩුවක් හෝ අලාභයක් සිදුවුණි නම්, සහ එම පාඩුව හෝ අලාභය සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීමට අවශ්‍ය නම්, ඔවුන්ගේ එම පාඩුව හෝ අලාභය සම්බන්ධයෙන් 2018 අප්‍රියෙල් 19 දින ප.ව. 4.00 වන විට ඒ සම්බන්ධ තොරතුරු OAIC වෙත ලබාදීම අවශ්‍ය වන බවයි.

දැන්වීම සඳහා ප්‍රතිචාර දැක්වීමට දී තිබූ කාලය 2018 ඔක්තෝබර් 19 වන දින තෙක් දීර්ඝ කරන ලදී. OAIC මගින් සමහර පංති සාමාජිකයන් හට ලබා දුන් කාලය 2019 අප්‍රියෙල් 22 තෙක් දීර්ඝ කරන ලද අතර 2019 අප්‍රියෙල් 22 වන විට සියළු සැලකර සිටීම් අවසානයට පත් කරන ලදී.

## තීරණය

2021 ජනවාරි 11 වන දින, කොමසාරිස්වරයා විසින් පුද්ගලිකතා පනතේ 52 වන වගන්තිය යටතේ තීරණයක් නිකුත් කරන ලදී (**තීරණය**).

තීරණය මගින් පහත දේ සොයා ගන්නා ලදී:

- දත්ත උල්ලංඝනය හේතුවෙන්, දෙපාර්තමේන්තුව මගින් පුද්ගලයෙකුගේ පුද්ගලිකත්වයට මැදිහත් වන ආකාරයේ හැසිරීමක නිරතවී ඇත; එසේම

- දැන්වීමට ප්‍රතිචාර වශයෙන් සැලකර සිටීම් ඉදිරිපත් කල සහ/හෝ පාඩුව හෝ අලාභය සම්බන්ධයෙන් තොරතුරු ලබා දුන් පංති සාමාජිකයන් හට (**සහභාගිවූ පංති සාමාජිකයන්**) කොමසාරිස්වරයා තීරණය කරන ආකාරයට වන්දි ගෙවීම සිදු කල යුතුය.

කොමසාරිස්වරයා තීරණය කලේ සහභාගිවුණු පංති සාමාජිකයන් හට පහත වගුවේ දක්වා ඇති ආකාරයට පාඩුවේ හෝ අලාභයේ කාණ්ඩය අනුව වන්දි ගෙවිය යුතු බවයි (1 **වන වගුව**).

# 1 වන වගුව

## පංති සාමාජිකයන් හට සිදුවූ පාඩුව හෝ හානිය සම්බන්ධ කාණ්ඩ වගුව සහ වන්දි ගෙවීම සඳහා දක්වා ඇති ප්‍රමාණ

| **ආර්ථික පාඩුවක් නැති කාණ්ඩය** | | **+ ආර්ථික පාඩුව**<br>(එක් එක් කරුණ මත ගණනය කිරීම) |
|---|---|---|
| **0** | සැලකර සිටීමක් නොකල සහ/හෝ දත්ත උල්ලංඝනය හේතුවෙන් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධ සාක්ෂි ඉදිරිපත් කර නැති අය | |
| **1** | දත්ත උල්ලංඝනය හේතුවෙන් සාමාන්‍ය උත්සුකභාවය, භය, කණස්සල්ල හෝ දුෂ්කරතාවයට පත්වීම | |
| **2** | දත්ත උල්ලංඝනය හේතුවෙන් නින්ද අඩුවීම හෝ හිසරදය, සෞඛ්‍යය වෘත්තිකයන් හමුවීමට යාම වැනි සුළු මානසික රෝග ලක්ෂණ ඇතිවිය හැකි මධ්‍යස්ථ උත්සුකභාවය, බිය, වේදනාව සහ විඳවීම, විෂාදය හෝ දුෂ්කරතාවයට පත්වීම | |
| **3** | දත්ත උල්ලංඝනය හේතුවෙන් කල් පවතින උත්සුකභාවය, බිය, වේදනාව සහ විඳවීම, විෂාදය හෝ දුෂ්කරතාවයට පත්වීම සහ මේ හේතුවෙන් සෞඛ්‍යය වෘත්තිකයන් හමුවීමට යාම වැනි මානසික හෝ වෙනත් හානි සිදුවීම සහ ඒ හේතුවෙන් සාමාන්‍ය වෘත්තිකයෙකුගෙන් නියම කරන ලද ප්‍රතිකාර ලබා ගැනීම. | |
| **4** | දත්ත උල්ලංඝනය හේතුවෙන් මානසික සෞඛ්‍යය තත්වයක් උග්‍රවීම සහ මේ හේතුවෙන් ප්‍රතිකාර සඳහා සෞඛ්‍ය විශේෂඥයෙකු වෙත යොමු කිරීම | |
| **5** | දත්ත උල්ලංඝනය හේතුවෙන් දැඩි ලෙස පාඩු හෝ අලාභ සිදුවීම | |

| **ආර්ථික පාඩුවක් නැති කාණ්ඩ** |
|---|
| 0 කාණ්ඩය: $0 |
| 1 කාණ්ඩය: $500 - $4000 |
| 2 කාණ්ඩය: $4001 - $8000 |
| 3 කාණ්ඩය: $8001 - $12 000 |

| | |
|---|
| 4 කාණ්ඩය: $12 001 - $20 000 |
| 5 කාණ්ඩය: > $20,000 |

1 වන වගුව සකසා ඇත්තේ ආර්ථික පාඩුවක් නැති අවස්ථාවල වන්දි ගණනය කිරීමට උපකාර කිරීමටය. එයින් ආර්ථික පාඩුව සම්බන්ධයෙන් පාඩු ගණනය කිරීමට උපකාර කිරීමට අරමුණුකර නැත. දත්ත උල්ලංඝනය හේතුවෙන් තමා හට ආර්ථික පාඩුවක් සිදුවූ බවට කරුණු ඉදිරිපත් කල හා ඒ බව තහවුරු කිරීමට සාක්ෂි ලබා දුන් සහභාගි වන පංති සාමාජිකයන් හට ආර්ථික පාඩුව සම්බන්ධයෙන් ගෙවිය යුතුය. ආර්ථික පාඩුව සම්බන්ධ ඇගයීම එක් එක් අය සම්බන්ධයෙන් වෙන වෙනමම කරනු ඇත.

දත්ත උල්ලංඝනය හේතුවෙන් සහභාගිවන පංති සාමාජිකයන් හට පාඩුවට හෝ අලාභයට වන්දි ගෙවීම සහ අවසානයට පත් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේනතුව මගින් ඇගයීමේදී අනුගමනය කල යුතු ක්‍රියාවලිය තීරණය මගින් දක්වා ඇත.

සාරාංශ වශයෙන්, ක්‍රියාවලියට පහත දේ ඇතුලත්ව ඇත:

- එක් එක් සහභාගිවන පංති සාමාජිකයා විසින් කරුණු සැලකර සිටීම සහ/හෝ ඉදිරිපත් කරන ලද පාඩුව හෝ අලාභය සම්බන්ධ සාක්ෂි පදනම් කරගෙන පංති සාමාජිකයන් විසින් ඉදිරිපත් කල කරුණ අනුව, සකසන ලද වගුවේ ඇති ගණනය කිරීම් අනුව දෙපාර්තමේන්තුව මගින් එක් එක් පංති සාමාජිකයා හට වන්දි ප්‍රමාණයක් තීරණය කරනු ඇත.
- යෝජිත වන්දි ප්‍රමාණය සහ ලබාදුන් අදාල සාක්ෂි, සහභාගිවන පංති සාමාජිකයා හෝ ඔවුන්ගේ නියෝජිතයා හට ලබාදී වන්දි ප්‍රමාණය සම්බන්ධයෙන් ඔවුන්ගේ එකඟතාවය ඉල්ලා සිටිනු ඇත.
- ලබාදෙන වන්දි ප්‍රමාණය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සහ පංති සාමාජිකයා එකඟ නොවන අවස්ථාවක, දෙපාර්තමේන්තුව මගින් වන්දි ප්‍රමාණය නැවත ගණනය කල හැකි අතර, සහභාගිවන පංති සාමාජිකයා හෝ ඔවුන්ගේ නියෝජිතයාගෙන් නැවත ගණනය කල වන්දි ප්‍රමාණය සම්බන්ධයෙන් එකඟතාවය ඉල්ලා සිටිනු ඇත.
- නැවත ගණනය කිරීමෙන් පසු වගුවේ ඇති කුමන කාණ්ඩයට සහභාගිවන පංති සාමාජිකයා අයත්වේද යන්න එකඟතාවයකට පැමිණීමට නොහැකි තාක් දුරට සහ වෙනස් අදහස් සම්බන්ධ එක් එක් පාර්ශවයට යම් සාක්ෂි ඇති අවස්ථාවල, විශේෂඥ ඇගයීමක් මගින් වැඩිදුර සැලකර සිටීම් ලබාගත යුතුය. මෙයට ව්‍යතිරේකය වන්නේ නැවත ඇගයීම ලැබී (එවැනි නැවත ඇගයීමක් ඇතිනම්) දින 28 ක් ඇතුලත වගඋත්තරකරුගේ ඇගයීමට සහභාගිවන පංති සාමාජිකයා විසින් ප්‍රතිචාර දක්වා නොමැති අවස්ථාවල, ප්‍රාථමික ඇගයීමක් කල පසු ඕනෑම අවස්ථාවක දෙපාර්තමේන්තුව මගින් යම් කරුණක් විශේෂඥ ඇගයීමකට යොමු කල හැකිය.

කොමසාරිස්වරයා විසින් ක්‍රියාවලිය අවසානයේ නිරාකරණය වී නැති ඉල්ලීම් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි ප්‍රමාණය තීරණය කරනු ඇත.

නියමිත දිනට පෙර OAIC වෙත සැලකර සිටීමක් සිදු නොකල සහ/හෝ සාක්ෂි ලබා නොදුන්, සහ මෙයින් ඉවත් නොවූ, පුද්ගලිකත්වයට මැදිහත්වීම හේතුවෙන් පාඩුවක් හෝ හානියක් සිදුවූ බවට තහවුරු නොකල පංති සාමාජිකයන් විසින් තවදුරටත් කටයුතු කිරීම නුසුදුසු බව කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

# නිතර අසන ප්‍රශ්න

## තීරණය මට අදාලද යන්න මට පැහැදිලි නැත

2014 ජනවාරි 31 වන දින මධ්‍යම රාත්‍රියේ ඔබ ඕස්ට්‍රේලියාවේ මුල් භූමියේ හෝ ක්‍රිස්මස් දූපතේ සංක්‍රමණ රැඳවුමේ සිට, නියෝජන පැමිණිල්ලේ කොටසකින් බැහැර වී නොමැති නම්, 'පංති සාමාජිකයෙකු' වශයෙන් තීරණය ඔබටද අදාවේ.

පංති සාමාජිකයින් අතරට 2014 ජනවාරි 31 වන දින ප්‍රජා තීරණයක් යටතේ ප්‍රජාව තුල ජීවත්වුණු 3,391 ක ප්‍රමාණයක් ඇතුළුව සංක්‍රමණ රැඳවුම් පහසුකම් සහ විකල්ප රැඳවුම් ස්ථානවල සිටි පංති සාමාජිකයන් 5,867 ක් (මුල් භූමියේ සංක්‍රමණ රැඳවුම්වල සිටි 3,967 සහ ක්‍රිස්මස් දූපතේ සංක්‍රමණ රැඳවුමේ සිටි 1,900 දෙනා ඇතුළුව) ඇතුලත්වේ.



OAIC

## සියළුම පංති සාමාජිකයන් හට වන්දි ගෙවීම කල යුතුද?

නැත.

දත්ත උල්ලංඝනය හේතුවෙන් පාඩු හෝ අලාභ සිදුවූ බවට තහවුරු කරන ලද, දැන්වීමට ප්‍රතිචාර දැක්වූ සැලකර කිරීම් යොමුකල පංති සාමාජිකයන් හට කොමසාරිස්වරයා තීරණය කල ආකාරයට වන්දි ලබා දිය යුතුය.

ලබා දුන් කාලය තුලදී සැලකර සිටීමක් ඉදිරිපත් නොකල සහ/හෝ පාඩුව හෝ අලාභය සම්බන්ධ සාක්ෂි OAIC වෙත ලබා නොදුන් සහ, මෙයින් බැහැර වීමක් නොකල පංති සාමාජිකයින් විසින්, සිය පුද්ගලිකතාවයට මැදිහත්වීම හේතුවෙන් පාඩුවක් හෝ අලාභයක් ඇති බවට තහවුරු කර නොමැත. මෙම හේතුවෙන් ඔවුන් හට වන්දි ගෙවීමක් සිදු නොකරනු ඇත.

## මා හට වන්දි ගෙවිය යුතුද යන්න මා විසින් දැනගන්නේ කෙසේද?

දත්ත උල්ලංඝනය හේතුවෙන් පාඩු හෝ අලාභ සිදුවූ බවට තහවුරු කරන ලද, දැන්වීමට ප්‍රතිචාර දැක්වූ සැලකර කිරීම් යොමුකල පංති සාමාජිකයන් හට කොමසාරිස්වරයා තීරණය කල ආකාරයට වන්දි ලබා දිය යුතුය.

ඔබ මෙම සහභාගිවන පංති සමාජිකයන්ගෙන් එක් අයෙකු නම්, ඔබගේ ඉල්ලීම ඇගයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ඔබට ලිපියක් එවන අතර, ඔවුන්ගේ ඇගයීම පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අවස්ථාවක් ඔබට ලබා දෙනු ඇත.

කොමසාරිස්වරයා විසින් තීරණය කල ආකාරයට වන්දි ලබා දිය යුතු පංති සාමාජිකයන්ගෙන් එක් අයෙකු ඔබද යන්න පැහැදිලි නැතිනම්, ඔබ විසින් enquiries@oaic.gov.au යන ඊමේලය ඔස්සේ OAIC සමඟ සම්බන්ධ විය හැකිය.

## මීළඟ පියවර කුමක්ද?

ඔබ සහභාගිවන පංති සාමාජිකයන්ගෙන් එක් අයෙකු නම්, මීළඟ පියවර වන්නේ දෙපාර්තමේන්තුව මගින් ඔබට ලිපියකින් පහත උපදෙස් ලබා දීමයි:

- ඔබගේ ඉල්ලීම 1 වන වගුවේ කුමන කාණ්ඩයක පාඩුවක් හෝ අලාභයක් යටතට වැටේද යන්න
- ආර්ථික නොවන පාඩුව /හෝ ආර්ථික පාඩුව සඳහා ඔබට ගෙවිය යුතු මුදල සම්බන්ධ ඇගයීම
- අදාල ඇගයීම සම්බන්ධ හේතු, සහ
- දෙපාර්තමේන්තුවේ ඇගයීම සම්බන්ධයෙන් ඔබගේ කැමැත්ත හෝ අකමැත්ත පළ කිරීම සඳහාවූ පෝරමයක් සම්පූර්ණ කිරීම.

දෙපාර්තමේන්තුවේ ඇගයීමෙන් පසු එයට ප්‍රතිචාර දැක්වීමට ඔබට දින 28 ක් ඇත. ඇගයීම සලකා බැලීම සඳහා ඔබට වැඩිපුර කාලය අවශ්‍ය නම්, කාලය දීර්ඝ කර ගැනීමට ඉල්ලීම සඳහා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වන්න.

## දෙපාර්තමේන්තුවේ ඇගයීම සම්න්ධයෙන් මා එකඟ වේ නම් කුමක් සිදුවේද?

ඔබගේ ඉල්ලීම සම්බන්ධ දෙපාර්තමේන්තු ඇගයීම සම්බන්ධයෙන් ඔබ එකඟ වේ නම්, ඇගයීම සමඟ ඔබට ලබාදුන් ප්‍රතිචාර පෝරමය ඔබ විසින් පිරවීම සිදුකල හැකිය. ප්‍රතිචාර දැක්වීමේ පෝරමයේ දෙපාර්තමේන්තුවේ ඇගයීම හා ඔබ එකඟවන බව දැක්විය යුතු අතර, එම අවස්ථාවේදී දෙපාර්තමේන්තුව විසින් සාධාරණ කාලයක් තුල ඔබ විසින් නම්කල බැංකු ගිණුමකට එකඟවූ වන්දි මුදල ගෙවනු ඇත. සාමාන්‍යයෙන් මෙය එකඟතාවයට පැමිණ **දින 14 ක්** ඇතුලත සිදුවන අතර, මෙය අදාල අයුරින් මෙඩිකෙයාර් වෙතින් වැයවූ මුදල් නැවත ගෙවීම සම්බන්ධ සනාථ කිරීමකට යටත්වේ.

වැයවූ මුදල් නැවත ගෙවීම සහ දැනුම්දීමේ වගකීම් ඇති වන්නේ මෙඩිකෙයාර් වෙතින් ගෙවීම් සිදුකල ඔබ වෙත ලබා දුන් සමහර වෘත්තීය සේවා සම්බන්ධයෙනි. වැඩිදුර විස්තර පහත සපයා ඇත. වන්දි ගෙවීමක් හේතුවෙන් ඔබට සෙන්ටර්ලින්ක් මගින් ගෙවීම්වලට බලපෑම් ඇතිවිය හැකිය.

දෙපාර්තමේන්තුවේ ඇගයීම ලැබීමෙන් **දින 28 ක්** ඇතුලත ඔබ විසින් ප්‍රතිචාර දැකවීමේ පෝරමය දෙපාර්තමේන්තුව වෙතට යැවිය යුතුය.

## දෙපාර්තමේන්තුවේ ඇගයීම සම්බන්ධයෙන් මා එකඟ නොවේ නම් කුමක් සිදුවේද?

ඔබගේ ඉලලීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ ඇගයීම ගැන ඔබ එකඟ නොවේ නම්, ඔබට දෙපාර්තමේන්තුව මගින් ලබාදුන් ප්‍රතිචාර පෝරමය සම්පූර්ණ කර ඔවුන්ගේ ඇගයීම ඔබ ප්‍රතික්ෂේප කරන බවට දැක්විය යුතුය. දෙපාර්තමේන්තුවේ ඇගයීම ලැබීමෙන් **දින 28 ක්** ඇතුලත ඔබ විසින් ප්‍රතිචාර දැකවීමේ පෝරමය දෙපාර්තමේන්තුව වෙතට යැවිය යුතුය.

බොහෝ අවස්ථාවල දෙපාර්මේන්තු විසින් වන්දි සම්බන්ධ ඔබගේ ඉල්ලීම නැවත ඇගයීමකට ලක් කරන අතර ඔවුන්ගේ ඇගයීම පිළි ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අවස්ථාවක් ලබා දෙනු ඇත. සමහර අවස්ථාවල දෙපාර්තමේන්තුව විසින් නැවත ඇගයීමක් කරනවා වෙනුවට ඔබගේ ඉල්ලීම විශේෂඥ ඇගයීමකට යොමු කිරීම කල හැකිය. දෙපාර්තමේන්තුවේ නැවත ඇගයීම ලැබීමෙන් පසු එය පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඔබට තව **දින 28** ක් ලැබෙනු ඇත. නැවතත්, ඇගයීම සලකා බැලීම සඳහා ඔබට වැඩිපුර කාලය අවශ්‍ය නම්, කාලය දීර්ඝ කර ගැනීමට ඉල්ලීම සඳහා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වන්න.

ඔබට වගුවේ ලබාදී ඇති කාණ්ඩය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ නැවත ඇගයීම සම්බන්ධයෙන් ඔබ එකඟ නොවන්නේ නම් සහ, වෙනස් අදහස් සම්බන්ධයෙන් එක් එක් පාර්ශවය විසින් යම් සාක්ෂි ලබාදී ඇතිනම්, විශේෂඥ ඇගයීම ඔස්සේ වැඩිදුර සැලකර සිටීම් ලබාගත හැකිය. සමහර අවස්ථාවල දෙපාර්තමේන්තු මගින් නැවත ඇගයීමක් කිරීම වෙනුවට විශේඥ ඇගයීමකට යොමු කිරීම කල හැකිවේ.

## දෙපාර්තමේන්තුවේ ඇගයීම හෝ නැවත ඇගයීම සම්බන්ධයෙන් මා විසින් ප්‍රතිචාර නොදැක්වුවහොත් කුමක් සිදුවේද?

ප්‍රතිචාර දැක්වීම සම්බන්ධ කාලය දීර්ඝ කිරීමක් ලබා දීමට යටත්ව, දෙපාර්තමේන්තුවේ ඇගයීම ලැබී දින 28 ක් ඇතුලත ඔබ දෙපාර්තමේන්තුවේ ඇගයීමට ප්‍රතිචාර දැක්වීමට අසමත් වුවහොත්, හෝ දෙපාර්තමේන්තුවේ නැවත ඇගයීම ලැබී දින 28 ක් ඇතුලත (එවැන්නක් ඇතිනම්) ඔබ දෙපාර්තමේන්තුවේ නැවත ඇගයීමට ප්‍රතිචාර දැක්වීමට අසමත් වුවහොත්, ඔබ ප්‍රතිචාර නොදැක්වූ බව දෙපාර්තමේන්තුව මගින් OAIC වෙත දැනුම් දෙන අතර, කොමසාරිස්වරයා විසින් ඔබගේ වන්දියේ ප්‍රමාණය ප්‍රකාශයට පත් කරනු ඇත.

## විශේෂඥ ඇගයීමක් යනු කුමක්ද?

විශේෂඥ ඇගයීමකදී ස්වාධීන තුන්වන විශේෂඥ පාර්ශවයක් මගින් ඇගයීමක් කිරීම සිදුවේ. අදාල පාර්ශවයන් විසින් ලබා දුන් තොරතුර පදනම් කරගෙන විශේඥයා සිය විශේෂඥතාවය, සහ දැනුම භාවිතා කර ඇගයීමක් සිදු කරයි.

## විශේෂඥයා/යන් තෝරා ගන්නේ කෙසේද?

විශේෂඥය/යන් ස්වාධීන වන අතර OAIC මගින් හඳුනා ගත් ආකාරයට නියමකල කාර්ය්‍ය ඉටු කිරීමට ඔහුට/ඇයට අදාල සුදුසුකම් සහ පළපුරුද්ද ඇත.

විශේෂඥයා/යන් තෝරා ගන්නේ දෙපාර්තමේන්තුව සහ ස්ලේටර් ඇන්ඩ් ගෝර්ඩන් (**පාර්ශවයන්** සාමුහිකව) මගිනි. පාර්ශවයන් විශේඥයා/යන් සම්බන්ධයෙන් තීරණය කිරීමෙන් අනතුරුව, පාර්ශවයන් විසින් OAIC වෙත විශේඥයා/යන්ගේ නම්, ඔවුන්ගේ පසුබිම සම්බන්ධ විස්තර, සුදුසුකම් සහ පළපුරුද්ද, සහ ඔවුන් මේ සඳහා සුදුසු වන්නේ ඇයිද යන්න කෙටි විස්තරයක්, තොරතුරු කොමසාරිස්වරයාගේ අනුමැතිය සඳහා ලබා දෙනු ඇත.

## විශේෂඥයා විසින් සිය ඇගයීම සිදු කරන්නේ කෙසේද?

මෙහි ඇති කොමසාරිස්වරයාගේ තීරණයෙහි සඳහන් කර ඇති ආර්ථික සහ ආර්ථික නොවන පාඩුව ඇගයීම සම්බන්ධ නිර්ණායකයන්ට අනුකූලව විශේෂඥයා විසින් සිය නිර්දේශ සිදු කරනු ඇත.

සහාභාගිවන පංති සාමාජිකයා විසින් ඉල්ලා සිටින ලද ආර්ථික සහ/හෝ ආර්ථික නොවන පාඩුව සම්බන්ධයෙන් වන්දි මුදලක් විශේෂඥයා විසින් නියම කරනු ඇත. ආර්ථිකමය නෙවන පාඩු සම්බන්ධයෙන් විශේෂඥයා විසින් වන්දි තීරණය කරන්නේ ඉහත 1 වන වගුවට අනුකූලවය.

1 වන වගුව සකස් කර ඇත්තේ ආර්ථික නොවන පාඩු සම්බන්ධ වන්දි ගණනය කිරීමට උපකාර කිරීම සඳහාය. එය ආර්ථිකමය වශයෙන් සිදුවන පාඩුව ගණනය කිරීමට උපකාර කිරීමට අදහස් නොකරයි. ආර්ථික පාඩු සම්බන්ධ ගණනය කිරීම සඳහා එක් එක් ඉල්ලීම අනුව ඇගයීමක් කරනු ඇත.

විශේෂඥ ඇගයීම ලිපි ලේඛණ පදනම්ව සිදුවේ. පහත කරුණු මත විශේෂඥයා විසින් සහභාගිවන පංති සාමාජිකයා හට ගෙවිය යුතු වන්දිය සම්බන්ධයෙන් නිර්දේශ කරනු ඇත:

- දැන්වීමේ ඇති අවසන් දිනට පෙර සහභාගිවන පංති සාමාජිකයා විසින් OAIC වෙත ලබා දෙන සැලකර සිටීම් සහ/හෝ පාඩුව හෝ අලාභය සම්බන්ධ සාක්ෂි
- දෙපාර්තමේන්තුවේ ඇගයීම සහ හේතු
- දෙපර්තමේන්තුවේ නැවත ඇගයීම (එවැන්නක් ඇතිනම්) සහ හේතු
- සහභාගිවන පංති සාමාජිකයාගේ ප්‍රතිචාර පෝරමයේ ඇති ඕනෑම තොරතුරක්.

විශේඥයා විසින් සිය නිර්දේශ සහ එයට අදාල හේතු පර්ශවයන් හට පිටපත් කරමින් කෙළින්ම OAIC වෙත ලබා දෙනු ඇත.

## ඔවුන්ගේ ඇගයීම සිදු කිරීමට පෙර හෝ පසුව මා විසින් විශේෂඥයා හට තව දුරටත් සැලකර සිටීම් කිරීමට හෝ සාක්ෂි ඉදිරිපත් කිරීමට මා හට අවස්ථාව තිබේද?

නැත.

පාර්ශවයන් විසින් වාචිකව හෝ ලිඛිතව විශේෂඥයා හට වැඩිදුර සැලකර සිටීම් කිරීමට හෝ සාක්ෂි ලබා දීමට අවස්ථාවක් නොලැබේ.

## විශේෂඥයාගේ ඇගයීම මගින් බැඳීම් ඇති කරන්නේද?

නැත.

ඇගයීම මගින් නිර්දේශයක් පමණක් සිදු කරන අතර ඒ මගින් පාර්ශවයන් බැඳ තැබීමක් සිදු නොවේ.

## විශේෂඥයාගේ ඇගයීම පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට මා හට අවස්ථාවක් ලබා දෙන්නේද?

ඔව්.

විශේෂඥයාගේ ඇගයීමට ප්‍රතිචාර වශයෙන් සැලකර සිටීම් සිදු කිරීමට හෝ සාක්ෂි ඉදිරිපත් කිරීමට අයිතියක් නැත. කෙසේ වුවද, විශේෂඥයාගේ ඇගයීම පිළිගැනීමට හෝ ප්‍රතිෂේප කිරීමට අවස්ථාව ඇත.

## විශේෂඥයාගේ ඇගයීම සමග මම එකඟවේ නම් කුමක් සිදුවේද?

ඔබ විශේෂඥයාගේ ඇගයීම සමග එකඟවේ නම්, ඔබ එකඟ වන බවට දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතුය. දෙපාර්තමේන්තුවද ඇගයීම සමග එකඟවේ නම්, දෙපාර්තමෙන්තුව විසින් එකඟවූ වන්දි ප්‍රමාණය සාධාරණ කාලයක් ඇතුලත ඔබට ගෙවනු ඇත. සාමාන්‍යයෙන් මෙය එකඟතාවයට පැමිණ **දින 14 ක්** ඇතුලත සිදුවන අතර, මෙය අදාල අයුරින් මෙඩිකෙයාර් වෙතින් වැයවූ මුදල් නැවත ගෙවීම සම්බන්ධ සනාථ කිරීමකට යටත්වේ.

වැයවූ මුදල් නැවත ගෙවීම සහ දැනුම්දීමේ වගකීම් ඇති වන්නේ මෙඩිකෙයාර් වෙතින් ගෙවීම් සිදුකල ඔබ වෙත ලබා දුන් සමහර වෘත්තීය සේවා සම්බන්ධයෙනි.  වැඩිදුර විස්තර පහත සපයා ඇත.

## විශේෂඥයාගේ ඇගයීම සමග මම හෝ දෙපාර්තමේන්තුව එකඟ නොවේනම් කුමක් සිදුවේද?

ඔබගේ ඉල්ලීම සම්බන්ධයෙන් විශේෂඥයාගේ ඇගයීම සමග ඔබ එකඟ නොවේ නම්, ඔබ ඒ සම්බන්ධයෙන් එකඟ නොවන බව කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතුය. එසේ නොමැතිව, ඔබගේ ඉල්ලීම සම්බන්ධ විශේෂඥයාගේ ඇගයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව එකඟ නොවිය හැකිය. මෙම අවස්ථා දෙකෙහිදීම, ඔබගේ ඉල්ලීම සම්බන්ධ වන්දි ප්‍රමාණය කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබයි. මෙය හැකි විගස සිදුවන අතර, තීරණයෙන් මාස 12 කට නොවැඩි කාලයක් තුල සිදුවේ.

තීරණයෙන් පසු කොමසාරිස්වරයා විසින් තීරණය කල වන්දි මුදල් ප්‍රමාණය, දෙපාර්තමේන්තුව විසින් සාධාරණ කාලයක් ඇතුලත ඔබට ගෙවනු ඇත. සාමාන්‍යයෙන් මෙය තීරණය දැනුම්දී **දින 14 ක්** ඇතුලත සිදුවන අතර, මෙය අදාල අයුරින් මෙඩිකෙයාර් වෙතින් වැයවූ මුදල් නැවත ගෙවීම සම්බන්ධ සනාථ කිරීමකට යටත්වේ.

## නියෝජන පැමිණිලිකරුගේ කාර්‍ය භාරය කුමක්ද?

නියෝජන පැමිණිලිකරු පංති සමාජිකයන් වෙනුවෙන් අදාල පුද්ගලිකතා පැමිණිල්ල OAIC වෙත යොමු කල අතර, පංති සාමාජිකයන්ගේ අවශ්‍යතා නියෝජනය කරයි. ස්ලේටර සහ ගෝර්ඩන්, නියෝජන පැමිණිලිකරු වෙනුවෙන් කටයුතු කරයි.

නියෝජන පැමිණිලිකාර විසින් දෙපාර්තමේන්තුව සමඟ විශේෂඥයා/යන් තේරීම සහ සහභාගිවන පංති සාමාජිකයන් සමඟ ලිපි ගනුදෙනු කිරීමේ ටෙම්ප්ලේට් සකස් කර අවසාන කිරීම ආදී පංති සාමාජිකයන්ගේ ඉල්ලීම් කළමනාකරණය කිරීම සම්බන්ධ ක්‍රියාවලිය සම්බන්ධ දිගටම යෙදවුම් දක්වන අතර, නියෝජන පැමිණිලිකාර හට එක් එක් ඉල්ලීම විසඳීම පිළිබඳ කාර්‍ය භාරයක් නොමැත.

## දෙපාර්තමේන්තුවේ කාර්‍ය භාරය කුමක්ද?

දෙපාර්තමේන්තුවේ කාර්‍ය භාරය පහත ආකාරවේ:

- ඉහත 1 වන වගුවේ කුමන කාණ්ඩයකට පාඩුව හෝ අලාභය වැටේද යන්න ඇගයීම
- ඉල්ලීම සම්බන්ධ ගෙවිය යුතු වන්දි ප්‍රමාණය යෝජනා කිරීම
- එක් එක් සහභාගිවන පංති සාමාජිකයා සමඟ ගෙවන වන්දි ප්‍රමාණය සම්බන්ධ එකඟතාවය ලබා ගැනීම
- අවශ්‍ය අවස්ථාවල, මතභේදයට ලක්වුණු ඉල්ලීමක් සම්බන්ධ නැවත ඇගයීමක් කිරීම
- නියෝජිත පැමිණිලිකරු සමඟ එක්ව විශෂඥයා/යන් තෝරා පත්කර ගැනීම සහ විශේෂඥයා/යන් කොමසාරිස් වෙත අනුමැතිය වෙත ඉදිරිපත් කිරීම
- සමහර අවස්ථාවල පංති සාමාජිකයා සමඟ විශේෂඥ ඇගයීමට සම්බන්ධවීම
- විසඳී නොමැති ඉල්ලීම් සම්බන්ධ OAIC වෙත දැනුම් දීම

## කොමසාරිස්වරයාගේ කාර්‍ය භාරය කුමක්ද?

කොමසාරිස්වරයා විසින් ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ ක්‍රියාවලිය අවසානයේ විසඳී නොමැති ඉල්ලීම් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි ප්‍රමාණ තීරණය කිරීම.

ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේදී, කොමසාරිස්වරයා විසින් සහභාගිවන පංති සාමාජිකයන් විසින් ඇයට හෝ ඔහුට තීරණය යටතේ ලැබිය යුතු ගෙවීම් තීරණය කරන ආකාරය හෝ සහභාගිවන පංති සාමාජිකයන් විසින් තීරණය යටතේ ලැබිය යුතු ගෙවීම් සම්බන්ධ මතභේදයක් තීරණය කරන ආකාරය සම්බන්ධ සාධාරණ යයි සිතන ආකාරයට වැඩිදුරටත් අවශ්‍ය විධාන ඇය/ඔහු විසින් (එසේ යමක් ඇතිනම්) නියම කිරීම සිදු කරයි.

## අතීතයේ ලබාගත් මෙඩිකෙයාර් ප්‍රතිලාභ, වන්දි ගෙවීමට බලපාන්නේ කෙසේද?

වැයවූ මුදල් නැවත ගෙවීම සහ දැනුම්දීමේ වගකීම් ඇති වන්නේ මෙඩිකෙයාර් වෙතින් ගෙවීම් සිදුකල ඔබ වෙත ලබා දුන් සමහර වෘත්තීය සේවා සම්බන්ධයෙනි.

දත්ත උල්ලංඝනය හේතුවෙන් ඔබ ලබා දුන් වන්දි මුදල $5,000 ට වඩා වැඩි නම්, සහ ඔබ මෙඩිකෙයාර් කාඩ්පතක් දරණ අයෙකු නම්, ඔබට කිසියම් වන්දි මුදලක් ගෙවීමට පෙර මෙඩිකෙයාර් වෙතින් අතීතයේදී ගෙවූ ප්‍රතිලාභ සම්බන්ධ දැන්වීමක් මෙඩිකෙයාර් වෙතින් ඉල්ලා සිටිය යුතුය. අතීතයේදී ගෙවූ ප්‍රතිලාභ සම්බන්ධ දැන්වීමක් ලබා ගැනීමේ ප්‍රථම පියවර වන්නේ මෙඩිකෙයාර් ඉතිහාසය සම්බන්ධ ප්‍රකාශයක් ඉල්ලීමවේ.

https://www.servicesaustralia.gov.au/individuals/forms/mo026 යන වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් මෙඩිකෙයාර් ඉතිහාසය සම්බන්ධ ප්‍රකාශයක් ඉල්ලා සිටිය හැකිය.

## වන්දි මුදලක් ලබාදීම මගින් සෙන්ටර්ලින්ක් ගෙවීමට බලපෑම් ඇතිවේද?

වන්දි මුදලක් ලැබීම මගින් ඔබට ලැබෙන සෙන්ටර්ලින්ක් ගෙවීම්වලට බලපෑමක් ඇතිවිය හැකිය. ඔබට සෙන්ටර්ලින්ක් ගෙවීම් ලැබෙයි නම්, දුරකථන අංක 1800 777 653 හෝ 131 202 (බහුභාෂා දුරකථන සේවාව) අමතා ඔබගේ අවස්ථානුගත කරුණු සම්බන්ධ ඇතිවන බලපෑම සාකච්ඡා කරන්න.

## මා හට නොමිළේ උපකාර ලබා ගත හැක්කේ කොහින්ද?

### ඔබ වික්ටෝරියා හි ජීවත් වන්නේ නම්ඃ

**Asylum Seeker Resource Centre**
ඊමේල්: legal_triage@asrc.org.au
දුරකථන: (03) 9274 9827
සඳුදා හෝ බ්‍රහස්පතින්දා
ප.ව. 2 සිට ප.ව. 4 දක්වා

හෝ

**Refugee Legal**
ඊමේල්: refugeelegal@refugeelegal.org.au
දුරකථන: (03) 9413 0100
බදාදා හෝ සිකුරාදා
පෙ.ව. 10 සිට ප.ව. 2 දක්වා

### ඔබ නිව් සවුත් වේල්ස් හෝ ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි හෝ ක්වීන්ස්ලන්ඩ් හි රැඳවුමක ජීවත් වන්නේ නම්ඃ

**Refugee Advice & Casework Service (Aust) Inc.**
ඊමේල්: admin@racs.org.au
දුරකථන: (02) 8355 7227

### ඔබ සවුත් ඕස්ට්‍රේලියා හෝ තස්මේනියා හි ජීවත් වන්නේ නම්ඃ

**Refugee Legal**
ඊමේල්: refugeelegal@refugeelegal.org.au
දුරකථන: (03) 9413 0100
බදාදා හෝ සිකුරාදා
පෙ.ව. 2 සිට ප.ව. 2 දක්වා

ඔබ නොදර්න් ටෙරිටරි හි ජීවත් වන්නේ නම්ඃ

**Refugee Advice & Casework Service (Aust) Inc.**
ඊමේල්: admin@racs.org.au
දුරකථන: (02) 8355 7227

හෝ

**Refugee Legal**
ඊමේල්: refugeelegal@refugeelegal.org.au
දුරකථන: (03) 9413 0100
බදාදා හෝ සිකුරාදා
ප.ව. 10 සිට ප.ව. 2 දක්වා

ඔබ වෙස්ටර්න් ඕස්ට්‍රේලියා හි ජීවත් වන්නේ නම්ඃ

**Circle Green Community Legal**
ඊමේල්: migration@circlegreen.org.au
දුරකථන (08) 6148 3636
පුද්ගලිකවඃ
අඟහරුවාදා ප.ව. 2 සිට 5 දක්වා
Asylum Seeker Hub
Riverview Church
1 Thorogood Street
Burswood WA 6100

හෝ

**Refugee Legal**
ඊමේල්: refugeelegal@refugeelegal.org.au
දුරකථන: (03) 9413 0100
බදාදා හෝ සිකුරාදා
ප.ව. 10 සිට ප.ව. 2 දක්වා

ඔබ ඕස්ට්‍රේලියාවේ රැඳවුමක ජීවත් වන්නේ නම්ඃ

**Asylum Seeker Resource Centre**
ඊමේල්: legal_triage@asrc.org.au
දුරකථන: (03) 9274 9827
සඳුදා හෝ බ්‍රහස්පතින්දා
ප.ව. 2 සිට ප.ව. 4 දක්වා

ඔබ ජීවත් වන්නේ ක්වීන්ස්ලන්ඩ් හි නම් හෝ ඉහතින් සඳහන් කල සංවිධාන මගින් ඔබගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා නොදෙයි නම්, පහත ආකාරයට සම්බන්ධ විය හැකියඃ

**Slater and Gordon Lawyers**
ඊමේල්: databreach@slatergordon.com.au
දුරකථන: (03) 9602 8658

## වැඩිදුර විස්තර

මෙම කරුණ සම්බන්ධයෙන් ඔබට වැඩිදුර ගැටළු ඇතිනම්, enquiries@oaic.gov.au යන ඊමේල් ඔස්සේ OAIC සමග සම්බන්ධ විය හැකිය.

ඔබට ඉංග්‍රීසි හැර වෙන භාෂාවක් සම්බන්ධයෙන් OAIC වෙතින් උපකාර අවශ්‍ය නම්, දුරකථන අංක 131 450 ඔස්සේ භාෂා පරිවර්තන සහ තෝල්ක සේවා අමතා දුරකථන අංක 1300 363 992 ඉල්ලා සිටින්න.  දැනට OAIC වෙතින් අඟහරුවාදා, බදාදා, සහ බ්‍රහස්පතින්දා යන දිනවල පෙ.ව. 10 සිට ප.ව. 4 දක්වා දුරකථන ඇමතුම් ලබා ගනී.

## නොමිළේ ලබාදෙන පරිවර්තන උපකාර

දෙපාර්තමේන්තුව මගින් සිය සියළු ලිපි ගනුදෙනු පහත සඳහන් භාෂා 20 කින් එකකට පරිවර්තනය කිරීමට කටයුතු සිදු කරනු ඇත. ක්‍රියාවලියේ මුල් අවධියේදී ඔබ හට ලිපි ගනුදෙනු ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවකින් ලබා ගැනීමට කැමතිද යන්න විමසනු ඇත.

ඔබ විසින් දෙපාර්තමේන්තුව වෙත පහත භාෂාවකින් ලබා දෙන ඕනෑම තොරතුරක්, ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීමට පිළියෙල කර දෙනු ඇත.

මෙම පරිවර්තන සේවා සඳහා යන වියදම දෙපාර්තමේන්තුව මගින් ආවරණය කරනු ඇත.